# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,931 - 2015 සැප්තැම්බර් මස 04 වැනි සිකුරාදා - 2015.09.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 594 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 594 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 සැප්තැම්බර් මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

## වන්දනා ගමන් ආඥා පනත

### ගලේවෙල ඓතිහාසික බම්බාව රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික බම්බාව රජමහා විහාරස්ථානයේ, වාර්ෂික ඇසළ මහා පෙරහැර 2015 සැප්තැම්බර් මස 10, 11. දිනවල පැවැත්වෙන බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. යූ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

09 - 65

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

රිච්වේ ලෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0057 1000 1687.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ක් වූ අගෝස්තු මස 28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2011 මාර්තු මස 16 දාතම හා අංක 4687 දරන හා ජී.පී.අයි. උදයංගනී යන අය විසින් ලියා සහතික කරන ලද 2012 නොවැම්බර් මස 29 දාතම හා අංක 1548 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පීවී 63525 දරන රිච්වේ ලෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4687 සහ 1548 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක් කෝටි විසි පන් ලක්ෂ විසි දහස් නමසිය හැට නමයයි ශත තිස් දෙකක (රු. 1,25.20,969.32) මුදලක් 2014 අගෝස්තු මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක් කෝටි විසි පන් ලක්ෂ විසි දහස් නමසිය හැට නමයයි ශත තිස් දෙකක (රු. 1,25,20,969.32) මුදලද, 2014 අගෝස්තු මස 13 වැනි දින සිට අංක 4687 සහ 1548 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි දහ අට ලක්ෂ හතලිස් දහසක (රු. 1,18,40,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නවයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4687 සහ 1548 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, රයිගම් කොරළේ කුඹුකේ පත්තුවේ පිහිටි හොරණ නගර සභා සීමාවන් තුළ හොරණ වෝඩ් අංක 3 රත්නපුර පාරේ පිහිටි වරිපනම් අංක 103 දරන "අම්බලම්හේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක යන අය විසින් සාදන ලද 2013 අගෝස්තු මස 24 දාතම හා අංක 1953 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 3A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටස මායිම්, උතුරට : වරිපනම් අංක 99, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 2) සහ අංක 316 දරන පිඹුරේ ලොට් 5 ද, නැගෙනහිරට : අංක 316 දරන පිඹුරේ ලොට් 5 සහ වරිපනම් අංක 103, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 4) ද, දකුණට : වරිපනම් අංක 103, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 4) සහ ලොට් 3B සහ බස්නාහිරට : වරිපනම් අංක 99, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 2) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 06) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1953 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C 295/289 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී හොරණ වෝඩ් අංක 3, රත්නපුර පාරේ පිහිටි වරිපනම් අංක 101/1 දරන "අම්බලම්හේන" යැයි කියනු ලබන ඉඩමට අංක 1953 දරන එකී පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 3A ද, නැගෙනහිරට : වරිපනම් අංක 103, රත්නපුර පාර (අංක 316 දරන පිඹුරේ ලොට් 4) දකුණට : රත්නපුර පාර සහ බස්නාහිරට : වරිපනම් අංක

99 රත්න පුර පාර, (අංක 316 දරන පිඹුරේ ලොට් 2) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 01.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1953 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C 295/290 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

09 - 93

---

**මහජන බැංකුව - තංගල්ල ශාඛාව (067)**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.06.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ :

මහජන බැංකුවේ නමට තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මහත්මිය විසින් සහතික කරන ලද අංක 4790 හා 2010.08.02 දින දරන උකස්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම රංජිත් ගංගානාත් රූබසිංහ සහ චන්ද්‍රා යාපා පතිරණ යන අය විසින් සහ අංක 6438 හා 2012.01.18 දින දරන උකස්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම සියඹලගස්ආර එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ද පැහැර හැර ඇති බැවින් එකී අංක 4790 දරන උකස්කරය මත රුපියල් තුන්ලක්ෂ හතළිස් අට දහස් හාරසිය අටයි ශත විස්ස (රු. 3,48,408.20) ක මුදලක් සහ අංක 6438 දරන උකස්කරය මත රුපියල් පනස් අට ලක්ෂ තිස් දහස් හත්සිය අසූ අටයි ශත පනස් හත (රු. 58,30,788.57) ක මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව ඇත. එබැවින්, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් තුන්ලක්ෂ හතළිස් අට දහස් හාරසීය අටයි ශත විස්ස (රු. 34,48,408.20)ක මුදල සහ රුපියල් තුන්ලක්ෂ හතළිස් තුන් දහස් හත්සිය පනහ (3,43,750.00)ක මුදල මත 2015.01.04 දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත වර්ෂයකට සියයට දහසය (16%) බැගින් තවදුරටත් වූ පොලිය ද, රුපියල් පනස් අට ලක්ෂ තිස් තුන් දහස් හත්සිය අසූ අටයි ශත පනස් හත (රු, 58,30,788.57)ක මුදල සහ රුපියල් පනස් හත් ලක්ෂ අනූ තුන්දහස් හාරසීය හතරයි ශත පනස් පහ (රු. 57,93,404.55)ක මුදල මත 2014.12.31 දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත වර්ෂයකට සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය (Weekly AWPLR) + 4% බැගින් තවදුරටත් වූ පොලිය ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29 L වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, ඊඩින් තෙක් අයකරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 4790 හා 6438 දරන උකස්කරයන් මගින් උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ඊ. එස්. රාමනායක බලයලත් වෙන්දේසිකාර මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උකස් කර ඇති දේපළ හා පරිශ්‍ර පිළිබඳ විස්තරය**

**(01)**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බැදිගම (අ.ග.පි. 261) නමැති ගමෙහි පිහිටි අ.ග.පි. 261හි කැබලි අංක 55 AG (හි.පි. 387480), කැබලි අංක 55AK (හි.පි. 387494), කැබලි අංක 55AE ( හි.පි. 387627) හා කැබලි අංක 55AI (හි.පි. 388930) න් ඒකාබද්ධ වූ මිල්ලකපුවල හේන සහ මිල්ලකපුවල දෙණිය නමැති ඒකාබද්ධ ඉඩම, බලයලත් මිනින්දෝරු ඒ. වී. පී. එස්. පණ්ඩිතසේකර මහතා විසින් මැන 1997.09.19 වැනි දින සම්පාදිත අංක 970902 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද අංක 01 දරන කැබැල්ලට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මුල්ගිරිගල (අවසාන ගම් පිඹුරු අංක 241) ද, නැගෙනහිරට: අවසාන ගම් පිඹුරු අංක 261 හි අංක 55 AM, 55 AJ දරන කැබලි සහ අඩි 10ක් පළල පාර ද, දකුණට : අවසාන ගම් පිඹුරු අංක 261හි අංක 55 AJ, 61 (හි.පි. 198201), 55 AF (T.P. 385398) සහ 55 AC දරන කැබලි සහ හිඟුරෙහේන වැව ද, බස්නාහිරට : අවසාන ගම් පිඹුරු අංක 261හි අංක 55 AD, 55 AC, 55AF (හි.පි. 385398) දරන කැබලි සහ හිඟුරේහේන වැව ද යන සතර මායිම් තුළ පිහිටි අක්කර දහතුනයි, රූඩ් තුනයි, පර්චස් දහතුන (අ. 13, රූඩ් 03, පර්. 13)ක් විශාල ඉඩම සහ එය තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ අංක F 259/156 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

(02)

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බැදිගම (අ.ග.පි. 261) නමැති ගමෙහි පිහිටි මිල්ලකපුවල හේන (ටී.පී. 387495) යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම, බලයලත් මිනින්දෝරු ඒ. වී. පී. එස්. පණ්ඩිතසේකර මහතා විසින් මැන 2000.10.14 වැනි දින සම්පාදිත අංක 001003 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද අංක 02 දරන ප්‍රවේශ මාර්ගයට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 01 දරන කැබැල්ල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමේ අංක 01 දරන කැබැල්ල ද, බස්නාහිරට : අවසාන ගම් පිඹුරු අංක 261හි අංක 55 AK දරන කැබැල්ලද, යන සතර මායිම් තුළ පිහිටි පර්චස් නවය (අ. 0 රූඩ් 0, පර්. 09)ක් ප්‍රවේශ මාර්ගයෙහි මාර්ග අයිතිය ද වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක F 178/263 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 07ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට.

09 - 95

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| සැප්තැම්බර් | 2015.09.04 | සිකුරාදා | 2015.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.11 | සිකුරාදා | 2015.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.18 | සිකුරාදා | 2015.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.25 | සිකුරාදා | 2015.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2015.10.02 | සිකුරාදා | 2015.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.09 | සිකුරාදා | 2015.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.16 | සිකුරාදා | 2015.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.23 | සිකුරාදා | 2015.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.30 | සිකුරාදා | 2015.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2015.11.06 | සිකුරාදා | 2015.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.13 | සිකුරාදා | 2015.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.20 | සිකුරාදා | 2015.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.27 | සිකුරාදා | 2015.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.